# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2116/23 – 2019 මාර්තු 26 වැනි අඟහරුවාදා – 2019.03.26**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: අයිආර්/සීඕඑම්/03/2017/33.

**කාර්මික ආරාවුල් පනත 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ 2017.12.29 දිනැති හා අංක 2051/34 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2017.11.11 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් සීදූව, සීදුව විලේජ්, අංක 34 හි පදිංචි එම්. ආර්. එච්. බණ්ඩාර මයා හා අනෙක් පාර්ශ්වය වශයෙන් නුගේගොඩ, ජම්බුගස්මුල්ල මාවත, අංක 127 පිහිටි ෆ්ලෙක්ස්පොර්ට් ඉනොවේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2018.10.12 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2019 මාර්තු මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05


1A – G 29734 – 11 (2019/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: අයිආර්/සීඕඑම්/03/2017/33.

**කාර්මික අධිකරණයේ දී ය.**

*පළමු පාර්ශවය,*

එම්. ආර්. එච්. බණ්ඩාර මයා, අංක. 34, සීදූව විලේජ්, සීදූව

සහ

*නඩු අංකය: ඒ/52/2017*

*දෙවන පාර්ශවය,*

ෆ්ලෙක්ස්පොර්ට් ඉනොවේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්, අංක 127, ජම්බුගස්මුල්ල මාවත, නුගේගොඩ

අතර පවත්නා කාර්මික ආරවුල සම්බන්ධ ප්‍රදානය.

කම්කරු හා වෘත්තීය සබඳතා අමාත්‍ය හා සබරගමුව සංවර්ධන අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියැවෙන) පනත්වලින් සංශෝධනය වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් පනතේ 4 (1) වගන්තිය යටතේ කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව, උක්ත ආරවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා 2017 නොවැම්බර් මස 01 දින මා වෙත යොමු කර ඇත.

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කර ඇති උක්ත නියෝගය ප්‍රකාරව, ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස්වරයා විසින් 2017.11.11 දින එවා ඇති ලිපියේ දැක්වෙන්නේ, ''2013.11.01 සිට 2014.10.30 දක්වා ෆ්ලෙක්ස්පොර්ට් ඉනොවේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ප්‍රධාන විධායක නිලධාරි ලෙස සේවය කර ඇති එම්. ආර්. එච්. බණ්ඩාර මහතාට ඔහුගේ එම සේවා කාලය තුළ පත්වීම් ලිපියේ සඳහන් කොන්දේසි අනුව දීමනා නිසි පරිදි නොගෙවීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමි විය යුතු සහනයන් කවරේ ද? යන්න පිළිබඳව වේ.''

***පෙනී සිටීම සහ බේරුම්කරණය විභාග පටිපාටිය***

මෙම පරීක්ෂණය 2018.06.08 දින මුල්වරට කැඳවන ලද දිනයේ සිට විභාගය අවසන් කරන ලද 2018.08.15 දිනය දක්වා කාලය තුළ 2018.06.08, 2018.07.05, 2018.07.24, 2018.08.15 වශයෙන් විභාගය සඳහා දින නියම කෙරිණි. මෙකී පරීක්ෂණ දිනවලින් 2018.07.05 දින පමණක් වගඋත්තරකාර පාර්ශවය වෙනුවෙන් ආයතනයේ ගිණුම් පරීක්ෂකවරයා සහභාගී වූ අතර, නීතිඥ හෝ වෙනත් නියෝජනයක් ද නොවීය. අනෙකුත් සියලුම දිනයන්හි ඉල්ලුම්කරු පමණක් ඔහුගේ නියෝජිතයෙකු ද සමග පෙනී සිටි අතර, වගඋත්තරකාර පාර්ශවයේ නොපැමිණීම මත මෙම නඩුව ඒක පාර්ශවිකව විභාගයට ගැනීමට සිදු විය.

***පසුබිම***

මෙම බේරුම්කරණය යොමු කිරීමට අදාළව උද්ගත වී ඇති කාර්මික ආරවුල පිළිබඳ පසුබිම වන්නේ පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුට දෙවන පාර්ශවය විසින් ගෙවීමට නියමිතව තිබූ වේතන විධිමත් පරිදි නොගෙවීමයි. ඉල්ලුම්කාර එම්. ආර්. එච්. බණ්ඩාර මහතාට නිකුත් කර ඇති පත්වීම් ලිපියෙහි සඳහන් ආකාරයට ඔහුගේ වේතනය කොටස් කීපයකින් යුක්ත බවත් එනම්,

| | | | |
|---|---|---|---|
| 1. | වැටුප | : | රු. 200,000 |
| 2. | ඉන්ධන දීමනා | : | රු. 50,000 |
| 3. | වාහන කුලිය | : | රු. 75,000 |
| 4. | දිරි දීමනා | : | රු. 25,000 |
| 5. | දුරකතන දීමනා | : | රු. 5,000 |
| | මුළු එකතුව | : | රු. 355,000 |

මෙම නඩුව 2018.07.05 දින විභාගයට ගත් අවස්ථාවේ පළමු පාර්ශවය ඉදිරිපත් වූ අතර, දෙවන පාර්ශවය වෙනුවෙන් ෆ්ලෙක්ස්පෝර්ට් ඉනොවේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ ගිණුම් පරීක්ෂක බිම්සර මහතා පෙනී සිටින ලදී.

පළමු පාර්ශවය ප්‍රකාශ කළේ තමන් 2013.11.01 සිට ක්‍රියාත්මක වන පරිදි ප්‍රධාන විධායක නිලධාරියා ලෙස දෙවන පාර්ශවයේ දැක්වෙන ආයතනයේ සේවයට බැඳුණු බවත්, 2014.10.30 දින ආයතනයෙන් ඉල්ලා අස් වූ බවත් ය. එකී සේවා කාලය තුළ තමන්ට ලබා දී ඇති පත්වීම් ලිපියේ සඳහන් වැටුප් හා දීමනා වශයෙන් වරින් වර රුපියල් 2,388,242 ක මුදලක් ගෙවූවද මූලික වැටුප සහ දීමනාවල එකතුව වන රු. 4,260,000 ක මුදලක් ගෙවිය යුතුව තිබූ බවයි. මේ පිළිබඳව බස්නාහිර පළාත් කම්කරු කාර්යාලයේ පැවති පැමිණිලි පරීක්ෂණයේ දී ද දෙවන පාර්ශවය ඉහත කී රු. 2,388,242 ක මුදල ගෙවූ බව පිළිගෙන ඇති බව ද ඉල්ලුම්කාර පළමු පාර්ශවය ප්‍රකාශ කළ අතර, ඒ අනුව තමාට හිමි විය යුතු හිඟ දීමනාවල එකතුව වශයෙන් රු. 1,870,158 ක් ඉල්ලා සිටින ලදී. තව ද ආරවුල කෙටියෙන් අවසන් කර ගැනීම පිණිස සමථයක් ලෙස රු. 1,000,000 මුදලක් ඉල්ලා සිටින ලදී.

මෙහිදී දෙවන පාර්ශවය සමථයට එකඟ නොවූ අතර එසේ එකඟ නොවීමට හේතු වශයෙන් පහත කරුණු පෙන්වා දෙනු ලැබිණි. :

1. සමස්ථ විකුණුම් ලක්ෂ 42 ක්ව තිබිය දී සමස්ථ සේවක වැටුප් පරිමාණය ලක්ෂ 8-9 ක් ව තිබියදී එකී නිලධාරියෙකුට පමණක් ලක්ෂ 3 1/2 වැටුපක් ගෙවිය නොහැකි බව.

2. වගඋත්තරකරු මේ හා සමාන අයතනයක් ආසන්න තැනක ආරම්භ කර ගැනීම නිසා දෙවන පාර්ශවයට අයත් ආයතනයේ ආදායම සීඝ්‍ර ලෙස අඩු වූ බව.

3. ඉල්ලුම්කරු විධිමත් ලෙස ආයතනයේ සේවයට වාර්තා නොකළ බව.

මෙදින දෙපාර්ශවය අතර සමථයක් ඇති නොවූයෙන් නඩුව විභාගය සඳහා 2018.07.24 පස්වරු 02.00 ට නියම කළ ද, එදිනට දෙවන පාර්ශවය නොපැමිණි අතර නොපැමිණීමට හේතු දක්වා ඇත්තේ විභාගයට නියමිත දින එනම් 2018.07.24 දින වේලාව පස්වරු 12.28 ට වේ. එමෙන්ම එකී දැන්වීමේ පිටපතක් හෝ පළමු පාර්ශවයට යවා නොතිබිණි. ඒ අනුව මෙදින නඩුව විභාගයට ගත නොහැකි විය. පළමු පාර්ශවය මෙදින නඩුවට සහභාගී වූ අතර දෙවන පාර්ශවයෙන් නඩු විභාගයට පෙනී සිටීමට නොහැකි බව මෝසමක් මගින් හෝ පළමු පාර්ශවයට දැනුම් නොදීමෙන් බේරුම්කරණ ක්‍රියාවලියට සහභාගී වීමට දෙවන පාර්ශවය විසින් චේතනාන්විතව මග හැර ඇති බවට චෝදනා කරන ලදී. මෙම තත්ත්වය මත නැවත විභාගය 2018.08.15 දින පස්වරු 02.00 ට පැවැත්වෙන බවත් එයට සහභාගී වන ලෙසත් ලියාපදිංචි තැපෑලෙන් 2018.07.26 දිනැති ලිපියෙන් අවසාන වශයෙන් දන්වා සිටිය ද, එදින දෙවන පාර්ශවය නොපැමිණෙන ලදී.

ඒ අනුව 2018.08.15 දින මෙම නඩුවේ විභාගය ඒකපාර්ශවිකව එනම් පළමු පාර්ශවයේ සහභාගීත්වය මත පමණක් සිදු කිරීමට සිදු විය. මෙහිදී සාක්ෂි ලබාදුන් පළමු පාර්ශවය මෙම බේරුම්කරණයට අදාළ ආරවුල තමාට (එනම් පළමු පාර්ශවයේ ඉල්ලුම්කරුට) වැටුප සමග ගෙවිය යුතු දීමනා නොගෙවීම සම්බන්ධ ආරවුලක් බව කියා සිටින ලදී. එමෙන්ම සාක්ෂිකරු වැඩි දුරටත් සාක්ෂි දෙමින් තමන් ෆ්ලෙක්ස්පෝර්ට් ඉනොවේෂන්ස් ආයතනයේ විධායක නිලධාරියා ලෙස පත් කර ඇති බවට එකී ආයතනයේ සභාපතිගේ අත්සනින් යුතු පත්වීම් ලිපිය A1 ලෙස සලකුණු කර ඉදිරිපත් කර සිටින අතර, වේතනයට අදාළ කොටස A1 (අ) ලෙස ලකුණු කරන ලදී. එකී පත්වීම් ලිපියෙන් පළමු පාර්ශවයට රු. 355,000 මුදලක් මූලික වැටුප සහ දීමනා වශයෙන් ගෙවීමට ඇති වූ එකඟතාවය මත තමා සේවය කිරීමට පටන් ගත් බව ද, සාක්ෂිකරු වැඩිදුරටත් ප්‍රකාශ කර සිටී. තව ද එකී පත්වීම් ලිපියේම වැටුපට අමතරව ලාභ බෙදා ගැනීමේ ක්‍රමයක් ද සටහන්ව ඇති බව A1 (ආ) වශයෙන් එකී කොටස සළකුණු කර ඇති බව ප්‍රකාශ කර සිටී.

තව ද, මෙකී ආරවුල සාකච්ඡා මගින් විසඳා ගැනීමට පළමු පාර්ශවය උත්සාහ කළ බවත් එකී උත්සාහය මත ආයතනය විසින් තමන්ට රු. 1,437,753 වටිනා චෙක්පතක් නිකුත් කර ඇති බවත් එය ගෙවීම නවතා දමා ඇති චෙක්පතක් ලෙස තමන් වෙත නැවත ලැබුණු බවත් එකී චෙක්පත A2 (අ) ලෙස ලකුණු කොට කියා සිටී. පසුව මේ පිළිබඳව විසඳුමක් නොවූයෙන් කම්කරු කාර්යාලයට පැමිණිලි කළ බවත් එකී පැමිණිල්ල A2 වශයෙන් සලකුණු කර සාක්ෂි ලබා දී ඇත. එමෙන්ම එකී පැමිණිල්ල පිළිබඳ පරීක්ෂණයේ දී පළමු පාර්ශවයේ යම් නීති විරෝධී ක්‍රියාවක් නිසා ඒ පිළිබඳ පරීක්ෂණ පවත්වන තෙක් දීමනා නතර කළ බවට මෙම නඩුවේ දෙවන පාර්ශවය කරුණු ඉදිරිපත් කර ඇති බව සාක්ෂිකරු කියා සිටී අතර, එවැනි පරීක්ෂණයක් කිසි දින සිදු නොකළ බව ද කියා සිටී. වැඩිදුරටත් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටින්නේ එවැනි විනය පරීක්ෂණයක් පිළිබඳව තමන්ට වාචිකව හෝ ලිඛිත දැන්වීමක් නොකළ බවයි.

සාක්ෂිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ තමා ආයතනයෙන් ඉල්ලා අස් වූ බවත් එකී ඉල්ලා අස්වීමේ ලිපිය දෙවන පාර්ශවය විසින් භාරගත් බවට සාක්ෂියේදී සලකුණු කර ඇති A3 දරන ලේඛනය එවා ඇති බවත් ය. ඒ අනුව තමාගේ ඉල්ලා අස්වීම 2014 ඔක්තෝබර් 31 දින සිට බලපැවැත්වෙන පරිදි වගඋත්තරකාර ආයතනය භාර ගෙන ඇති බවත් ය.

මේ හැර සාක්ෂිකරු ප්‍රකාශ කර සිටින්නේ A2 ලේඛනය පරිදි කම්කරු කොමසාරිස්වරයා වෙත තමා කළ පැමිණිල්ලට අනුව කම්කරු කාර්යාලය විසින් විමර්ශනයක් පවත්වා තමාට රු. 320,000 හිඟ වැටුප් මුදලක් ගෙවීමට නියමිත වූ බවයි. ඒ අනුව තමාට ලැබිය යුතු හිඟ මුදලින් ඉහත කී රු. 320,000 ක මුදල අඩු කර 1,354,855 මුදල බේරුම්කරණ කටයුත්තේ දී අය කර දෙන මෙන් අයැද සිටී. තව ද තමාගේ පෞද්ගලික ධනයද යොදා උපරිම කැපවීමකින් ආයතනයේ කටයුතු කර ඇති බැවින් මෙකී හිඟ දීමනා අය කර දෙන ලෙසද ඉල්ලා සිටින අතර ඒ පිළිබඳව තමන්ට නෛතික අයිතියක් ඇති බවද ප්‍රකාශ කර සිටී.

*ප්‍රදානය ඉදිරිපත් කිරීමේ ස්ථාවරය*

1. සමස්ථයක් ලෙස මෙම පැමිණිලි විභාගයේ කරුණු සලකා බැලීමේදී ඉහතින් ද සඳහන් කළ පරිදි පැමිණිල්ල විභාගයට නියමිත කළ දින වලින් 2018.06.08, 2018.07.24, 2018.08.25 යන දිනවල දෙවන පාර්ශවය පැමිණිලි විභාගය සඳහා පැමිණ නැත. නොපැමිණීම සම්බන්ධයෙන් කල්වේලා ඇතිව සාධාරණ හේතුවක් ද ඉදිරිපත් කොට නොමැත. මෙකී පසුබිම යටතේ දෙවන පාර්ශවය නොපැමිණියහොත් 2018.08.15 දින පැමිණිල්ල ඒකපාර්ශවිකව සිදු කළ හැකි බව දන්වා දෙවන පාර්ශවයට 2018.07.26 දින ලියාපදිංචි තැපෑලෙන් ලිපි යවා ඇත. එකී ලිපියට ද දෙවන පාර්ශවය කිසිදු ප්‍රතිචාරයක් දක්වා නොමැති හෙයින් මෙම පැමිණිලි විභාගය ඒක පාර්ශවිකව එනම්, පළමු පාර්ශවයේ පෙනී සිටීම හා සාක්ෂි මත පමණක් විභාගයට ගැනීම සාධාරණ සහ යුක්ති සහගත බව නිගමනය කරමි.

2. පළමු පාර්ශවයේ සාක්ෂියේදී ලකුණු කළ A1 ලේඛනයේ එනම්, පළමු, පාර්ශවය දෙවන පාර්ශවය විසින් පරිනමන ලද පත්වීම් ලිපියේ සඳහන් පරිදි දෙවන පාර්ශවය විසින් මෙම නඩුවේ පළමු පාර්ශවයට විධායක ශ්‍රේණියේ තනතුරක් පිරිනමා ඇත. තව ද, එකී පත්වීමේ ලිපියේ A1 (අ) වශයෙන් පළමු පාර්ශවය ලකුණු කොට ඇති කොටසට අනුව පළමු පාර්ශවයේ වැටුප් සහ දීමනා වශයෙන් සම්පූර්ණ වේතනය / පාරිශ්‍රමිකය සඳහන් කර ඇත. ඊට අමතරව පළමු පාර්ශවය ආයතනයට යොදන ලද ප්‍රාග්ධන මුදල් සම්බන්ධයෙන් දෙවන පාර්ශවය විසින් ලාභ ලබා දීමේ පිළිවෙතක්ද සටහන් කර ඇත. මේ අනුව පළමු පාර්ශවයේ වේතනය හෙවත් පාරිශ්‍රමිකය ලෙස වැටුපට අමතරව දීමනා ලබා දීම සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර එකඟතාවයක් ඇති බව පෙනේ. දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ලබා දී ඇති A1 පත්වීම් ලිපිය තුළින්ම වැටුපට අමතරව දීමනා ගෙවන බව තහවුරු කර පිළිගෙන ඇත. ඒ අනුව පළමු පාර්ශවය සේවය කළ කාලය තුළ වැටුප සමග දීමනා ද ඇතුළත් මුළු පාරිශ්‍රමිකය ලැබීමට පළමු පාර්ශවයට හිමිකම් ඇත. එනම් පළමු හා දෙවන පාර්ශවය අතර ඇති වූ සේවා ගිවිසුම (A1 ලේඛනය) අනුවම පළමු පාර්ශවය එහි සඳහන් ප්‍රතිලාභ ලැබීමට හිමිකම් ලබන බව දෙවන පාර්ශවය විසින්ම පිළිගෙන ඇත.

3. 2018.07.05 දින මේ පිළිබඳව නඩු විභාගයේ දී දෙපාර්ශවයම පෙනී සිටි අතර පළමු පාර්ශවය සඳහන් කර ඇත්තේ එකී වැටුප් සහ දීමනා වරින්වර තමාට ගෙවා ඇති බවත් ඒ අනුව තම සේවා කාලය තුළ රු. 2,388,242 ක මුදලක් ලැබී ඇති අතර හිඟ වැටුප් සහ දීමනා වශයෙන් රු. 1,870,158 ක් තවදුරටත් ලැබිය යුතුව ඇති බව ය.

මෙම ආරාවුල සම්බන්ධ විස්තර ප්‍රකාශ ඉදිරිපත් කරන ලෙස බේරුම්කරණය මගින් දෙවන පාර්ශවයට දැන්වූ පළමු අවස්ථාවේ එසේ ප්‍රකාශ ඉදිරිපත් නොකර දෙවන වරටද ප්‍රකාශ ඉදිරිපත් කරන මෙන් දැන්වූ පසු දෙවන පාර්ශවය 2018.03.21 දින තම ප්‍රකාශ ඉදිරිපත් කර ප්‍රකාශ කර සිටින්නේ මෙම කාර්මික ආරාවුල බටහිර කොළඹ පිහිටි කම්කරු කාර්යාලයේ දී විසඳා ගත් බවයි. එකී ප්‍රකාශයේ කිසිදු සඳහනක් කොට නොමැති ''මෙම නඩුවේ පළමු පාර්ශවයට ගෙවූයේ යම් අනුමාන කළ හැකි'' ගෙවීම් වවුචර්පත් ගණනාවක් දෙවන පාර්ශවය ඉහත කී ප්‍රකාශයට අමුණා ඉදිරිපත් කර ඇත. එකී වවුචර් පත්වල සඳහන් පරිදි, ''වැටුප් අත්තිකාරම්'', ''වැටුපෙහි කොටසක්'' ලෙස සඳහන් යම් යම් ගෙවීම් කර ඇති බව පෙනී යයි. මේ අනුව පළමු පාර්ශවයේ වැටුප සහ වේතනය කිසිදු අවස්ථාවක එක වර ගෙවා නොමැති බව පෙනේ. එමෙන්ම 2018.07.05 දින පළමු පාර්ශවය ප්‍රකාශ කළ පරිදි වැටුප් හා දීමනා වරින්වර ගෙවා ඇති බවද ඉහත කී වවුචර් පත් අනුව තහවුරු වේ. කෙසේ වුවද දෙවන පාර්ශවයේ පළමු ප්‍රකාශය තුළින් ද, පළමු පාර්ශවයේ වැටුප් සහ වේතන සම්පූර්ණයෙන් ගෙවූ බව තහවුරු නොවේ. එමෙන්ම විධිමත්ව වැටුප් ගෙවීම් ලේඛන පවත්වා නොමැති බව ද පෙනේ.

4. 2018.07.05 දින නඩු විභාගයේ දී පළමු පාර්ශවය වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින්නේ තමාගේ මූලික වැටුපෙන් හිඟව තිබූ රු. 320,000 මුදල පමණක් කම්කරු කාර්යාලයේ පැවැති පරීක්ෂණයේ දී අයකර දීමට නීත්‍යානුකූලව කටයුතු කෙරෙන බවයි. ඒ අනුවද පෙනී යන්නේ වැටුප් හා දීමනාවලින් යම් ප්‍රමාණයක් පළමු පාර්ශවය වෙත (දෙවන පාර්ශවය විසින්) නොගෙවා පැහැර හැර ඇති බවයි.

5. මේ හැර 2018.07.05 දින නඩු විභාගයේ දී දෙවන පාර්ශවය වෙනුවෙන් ඉදිරිපත් වූ ෆ්ලෙක්ස්පෝර්ට් ඉනොවේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ ගිණුම් පරීක්ෂක බිම්සර මහතා ප්‍රකාශ කර සිටින්නේ මෙම ආරාවුල පිළිබඳව සමථයට එළඹීමට නොහැකි වන්නේ,

 I. සමස්ත විකුණුම් ලක්ෂ 42 ක්ව තිබියදී සමස්ත සේවක වැටුප රුපියල් ලක්ෂ 8-9 ක්ව තිබියදී එක් නිලධාරියෙකුට පමණක් රුපියල් ලක්ෂ 3 1/2ක වැටුපක් නොගෙවිය හැකි බවත්,

 II. ඉල්ලුම්කරු මෙම ආයතනයට සමාන වෙනත් ආයතනයක් මෙම ආයතනයේ සේවකයින් සමග ආරම්භ කර ඇති නිසා මෙම ආයතනයේ ආදායම ශීඝ්‍රයෙන් අඩුවීමත්,

 III. ඉල්ලුම්කරු විධිමත් ලෙස සේවයට වාර්තා නොකිරීමත් යන හේතූන් වේ. එලෙස යම් ප්‍රකාශයක් දෙවන පාර්ශවය විසින් ඉදිරිපත් කල ද, එකී කරුණු තහවුරු කිරීමට නඩුවේ අවසානය දක්වා කිසිදු ලේඛනයක් හෝ වාචික සාක්ෂියක් ලබා දී නොමැත. එබැවින් ඉහත කී දෙවන පාර්ශවයේ කරුණු දැක්වීම හුදු ප්‍රකාශයක් පමණක් බව පෙනී යයි. තව ද

මෙහිදී පළමු පාර්ශවයට යම් හිඟ වේතනයක් ගෙවීමට නොමැති බව ප්‍රකාශ කොට නොමැති අතර නොගෙවීමට හේතු දැක්වීම පමණක් සිදු කිරීමෙන් යම් හිඟ වේතනයක් ගෙවීමට ඇති බව ව්‍යංගයෙන් වුව ද පිළිගෙන ඇති බවද පැහැදිලි වේ.

6. තවද, 2018.08.15 දින පළමු පාර්ශවය සාක්ෂි දෙමින් පවසා ඇත්තේ තමාට ගෙවිය යුතුව තිබූ හිඟ වැටුප් එකතුව තමා විසින් වාචිකව මෙන්ම ලිඛිතව දෙවන පාර්ශවයෙන් ඉල්ලා සිටීමේ දී ඒ වෙනුවෙන් තමන්ට රු. 1,437,753 ක වටිනාකමැති චෙක්පතක් එවූ බවත්, එම චෙක්පත අගරු චෙක්පතක් බවට, පෑන් ඒෂියා බැංකුව නිවේදනයක් තමන් වෙත එවා ඇති බවත් ය. එකී අගරු චෙක්පත් නිවේදනය A2 (අ) වශයෙන් පළමු පාර්ශවය සිය සාක්ෂියේදී ඉදිරිපත් කර සිටී. මෙකී චෙක්පත දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවයේ නමින් නිකුත් කළ බව A2 (අ) ලේඛනය පරීක්ෂා කිරීමේදී පෙනී යයි. පළමු පාර්ශවය තමාට හිමි විය යුතු හිඟ වේතන ලෙස මෙය එවා ඇති බව සිය සාක්ෂියේදී පළමු පාර්ශවය ප්‍රකාශ කර සිටින අතර දෙවන පාර්ශවය නඩු විභාගය සඳහා නොපැමිණි බැවින් ඒ පිළිබඳව හබ කිරීමක් ද නොමැත. ඒ අනුව මෙම චෙක්පත පළමු පාර්ශවයේ සාක්ෂියේදී දී ඇති ප්‍රකාශය පරිදි ''හිඟ වේතන සම්බන්ධ වන්නේ නම්,'' පළමු පාර්ශවයට යම් හිඟ වේතනයක් ලබා ගැනීමට ඇති බවද එයින් තහවුරු වේ. එසේම පසු අවස්ථාවක හෝ එකී අගරු චෙක්පතේ සඳහන් මුදල පිළිබඳව යම් ගෙවීමක් වගඋත්තරකාර දෙවන පාර්ශවය පළමු පාර්ශවය වෙත කළ බවට දෙවන පාර්ශවයෙන් කිසිදු විටෙක කරුණු ඉදිරිපත් කර නොමැති බැවින් මෙකී මුදල ගනුදෙනු වීමට පවතින මුදලක් ලෙස ද, සැළකිය හැක. එනම් පළමු පාර්ශවයට ලැබිය යුතු හිඟ වේතන මුදල ලෙස සැළකිය හැක.

7. ඉල්ලුම්කරුගේ 2018.08.15 දිනැති සාක්ෂියේදී තවදුරටත් තහවුරු වන්නේ මෙම නඩුවේ දෙවන පාර්ශවය 2015.09.02 දාතමින් යුතුව ලිඛිත සැළකිරීමක් කම්කරු දෙපාර්තමේන්තුවේ පැවැති පරීක්ෂණයට ඉදිරිපත් කළ බවත්, ''පළමු පාර්ශවය සම්බන්ධ වූ තරඟකාරී ව්‍යාපාරයක් පිළිබඳව විශ්වාස කටයුතු ආරංචි මාර්ගයකින් දැන ගැනීමට ලැබීම හේතුකොට ගෙන වගඋත්තරකාර ආයතනය පළමු පාර්ශවයට ගෙවූ දීමනා ඉවත් කිරීමට තීරණය කළ බව'' එකී ලිඛිත දේශනයේ සඳහන් බවත් ය. තව ද එකී ලිඛිත දේශනයේම සඳහන් පරිදි එකී තරඟකාරී ව්‍යාපාරය පැවැත්වීමට සම්බන්ධව කරුණු තහවුරු කර ගන්නා තෙක් දීමනා ගෙවීම නතර කර ඇති බව පළමු පාර්ශවයේ 2018.08.15 දිනැති සාක්ෂියේදී ප්‍රකාශ විය. සාක්ෂිකරු තවදුරටත් ප්‍රකාශ කර සිටින්නේ එවැනි අක්‍රමිකතාවන් සිදු වීමක් ගැන මේ දක්වා කිසිදු පරීක්ෂණයක් දෙවන පාර්ශවය විසින් සිදු නොකොට සේවා ගිවිසුමේ සඳහන් දීමනාවන් තමන්ට නොගෙවා ඇති බවයි. මෙලෙස කිසිදු පරීක්ෂණයකින් තොරව විශ්වාස කටයුතු ආරංචියක් මත යම් අක්‍රමිකතාවක් සිදු වූ බව දැනගත් පමණින් ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් නොපවත්වා සේවා ගිවිසුමේ සඳහන් දීමනා නොගෙවා පැහැර හැරීම යුක්තිසහගත හෝ සාධාරණ නොවන බවට නිගමනය කරමි.

8. ඉල්ලුම්කරු හෙවත් පළමු පාර්ශවය සිය 2018.08.15 දින සාක්ෂියේදී ප්‍රකාශ කර සිටින්නේ තමාට හිමි හිඟ වැටුප් එකතුව රුපියල් එක් මිලියන හය ලක්ෂ හැත්තෑහතර දහස් අටසිය පනස්පහක මුදලක් (රු. 16,74,855) ක් බවයි. ඒ අනුව අවසාන වශයෙන් ඉල්ලා සිටින්නේ කම්කරු දෙපාර්තමේන්තුවේ පැවැති පරීක්ෂණය මත ගෙවා ඇති රු. 320,000 ක මුදල ද, අඩු කළ පසු තමාට දීමනා වශයෙන් නොගෙවා පැහැර හැර ඇති රු. 1,354,855 ක මුදල අය කර දෙන ලෙසයි.

*ප්‍රදානය*

පළමු පාර්ශවයේ සහ දෙවන පාර්ශවයේ මැදිහත්වීම මත 2018.07.05 දින පැවැති සාකච්ඡාව සහ 2018.08.15 දිනැති සාක්ෂි මෙන්ම දෙපාර්ශවයේ මූලික ප්‍රකාශයන් ද සැලකිල්ලට ගෙන ඉහත 1 සිට 07 දක්වා ස්ථාවරයන්ට එළැඹ පහත ප්‍රදානය කරමි.

1. පළමු පාර්ශවය හා දෙවන පාර්ශවය අතර ඇති වූ සේවා ගිවිසුම පරිදි සේවක වැටුප් හා වේතන විධිමත්ව ගෙවා නොමැති අතර පළමු පාර්ශවයට නොගෙවා පැහැර හැර ඇති රු. 1,354,855 ක මුදල (දහතුන් ලක්ෂ පනස් හතර දහස් අටසිය පනස් පහක්), දෙවන පාර්ශවය විසින් පළමු පාර්ශවය වෙත ගෙවීමට නියෝග කරමි.

2. මෙම නියෝගය ශ්‍රී ලංකා ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කර මාස දෙකක් ඇතුළත ඉහත කී රු. 1,354,855 ක මුදල බටහිර කොළඹ කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතු ය.

3. මෙය සාධාරණ හා යුක්තිසහගත තීරණයක් වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

එච්. එම්. අනුලාවතී
බේරුම්කරු.

2018 ඔක්තෝබර් මස 12 වැනි දින දී ය.

04 – 275

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.